2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම.

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2027 වර්ෂය සඳහා පහත සඳහන් සැපයුම් හා සේවාවන් සැපයීම සඳහා ලියාපදිංචි වීමට සුදුසුකම් ලත් සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ලිපි ද්‍රව්‍ය.
2. කාර්යාල උපකරණ/ලී බඩු/වානේ ගෘහ භාණ්ඩ.
3. මුද්‍රණ සේවා.
4. වීදි පහන් අලුත්වැඩියාව සඳහා බල්බ හා උපාංග සැපයීම.
5. සෞඛ්‍ය /මාර්ග අංශ සඳහා සනීපාරක්ෂක ද්‍රව්‍ය හා උපකරණ.
6. වාහන හා යන්ත්‍ර සූත්‍ර අමතර කොටස් සැපයීම හා අලුත්වැඩියාව.
7. වාහන බැටරි /ටයර්/ටියුබ් සැපයීම
8. පරිගණක යන්ත්‍ර /ඡායා පිටපත් යන්ත්‍ර /ප්‍රින්ටර් අලුත්වැඩියාව හා අමතර කොටස් සැපයීම.
9. ටෝනර්/රිබන්/තීන්ත සැපයීම..
10. වායුසමීකරණ යන්ත්‍ර /ගිනි නිවීමේ උපකරණ සැපයීම හා අලුත්වැඩියාව.
11. නිල ඇඳුම්/සපත්තු/තිර රෙදි/ටී ෂර්ට්
12. පුස්තකාලපොත්/සගරා/පුවත්පත්.
13. ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය.
14. අභ්‍යන්තර දුරකතන පද්ධති/CCTV කැමරා පද්ධති නඩත්තු කිරීම හා එම උපකරණ සැපයීම.
15. නීති හා මිනින්දෝරු සේවා.
16. ආහාර, පලතුරු හා සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම.
17. ආදාහනාගාරය සඳහා ගෑස් සැපයීම.
18. කොන්ක්‍රීට් භාණ්ඩ/හියුම් පයිප්ප/සිමෙන්ති ගල්.
19. තාර /බොරළු ඇතුළු මාර්ග නඩත්තුවට අදාල ද්‍රව්‍ය.
20. පෙර පාසල් ක්‍රීඩා උපකරණ.
21. දැන්වීම්පුවරු/කටවුට්/බැනර්/ස්ටිකර.
22. පැලවර්ග/පොලිතින්/පොහොර උර/පොහොර/තෙල් ඇතුළු උද්‍යාන අලංකරන ද්‍රව්‍ය.
23. පිරිපහදු කළ ජලය සැපයීම.
24. වේලා සටහන් යන්ත්‍ර සැපයීම හා අලුත්වැඩියාව.
25. කිරුම් මිණුම් උපකරණ සැපයීම හා අලුත්වැඩියාව.
26. රබර් මුද්‍රා, දින මුද්‍රා, නාම පුවරු, දැන්වීම් පුවරු සැකසීම හා සැපයීම.
27. කාර්යාලීය විදුලි උපකරණ අලුත්වැඩියාව.

28. GPS ඒකක සැපයීම හා වාහන සඳහා GPS පද්ධති ස්ථාපිත කිරීම.
29. ආදාහනාගාර පෝරණුවලට අවශ්‍ය ද්‍රව්‍ය උපකරණ සැපයීම, නඩත්තුව හා අලුත්වැඩියාව.
30. මාධ්‍ය උපකරණ හා ඒ ආශ්‍රිත උපාංග සැපයීම. (කැමරා යන්ත්‍ර, වීඩියෝ උපකරණ, ශබ්ද විකාශන පද්ධති)
31. පදක්කම් හා කුසලාන සැපයීම.(සමරු තිළිණ, සමරු ඵලක,)
32. පරිගණක ජාලගත කිරීම, පරිගණක මෘදුකාංග සකස් කිරීම, සංවර්ධනය හා ස්ථාපිත කිරීම.
33. උත්සව සහ වැඩසටහන් වීඩියෝගත කිරීම සහ වාර්තාමය වැඩසටහන් සකස් කිරීම.
34. සනීපාරක්ෂක සේවා සැපයීම.
35. වාහන AC කිරීම හා AC අලුත්වැඩියාව.
36. වාහන කුෂන් කිරීම.(ටෙන්ට් රෙදි මැසීම හා ෂීට් කවර දැමීම)
37. වාහන හා යන්ත්‍ර සූත්‍ර වාර සේවා සැපයීම.
38. කම්මල් වැඩ හා ඒ ආශ්‍රිත සේවා සැපයීම.
39. පැස්සුම් වැඩ හා ඒ ආශ්‍රිත සේවා සැපයීම.
40. ICTAD ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාක්කරුවන්.(මාර්ග, ගොඩනැගිලි, පාලම්)
41. ගල් මෝල් හිමියන්.
42. ගස් කැපුම්කරුවන්
43. ප්‍රතිචක්‍රීකරණ අමුද්‍රව්‍ය මිලදී ගන්නා ආයතන.
44. කුලී පදනම මත වාහන යන්ත්‍ර හා උපකරණ ලබා දීම.
45. විකල්ප බලශක්ති උපාංග හා සේවා සැපයීම.
46. උත්සව කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ කුලියට සැපයීම.
47. බර වාහන හා බූම් ට්‍රක් රථ කුලියට සැපයීම.

<u>කොන්දේසි</u>

01. එම අයදුම්පත් **2026.12.25** දිනට පෙර **"ලේකම්,බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව ,බෙලිඅත්ත "** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත බහාලන කවරයේ වම්පස **"2027 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"**යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

02. එක් අයිතමයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව **රු.1000.00** වන අතර එක් එක් අයිතම සඳහා වෙන වෙනම අයදුම්පත් හා ඒ සඳහා වෙන් වෙන් වශයෙන් ගාස්තු ගෙවිය යුතුය.

03.ලියාපදිංචි කිරීමේ ගාස්තුව චෙක්පත් හෝ මුදලින් පමණක් ගෙවිය හැකිවන අතර චෙක්පත් **"ලේකම්,ප්‍රාදේශීය සභාව,බෙලිඅත්ත."**යන නමින් ලියා තිබිය යුතුය.

04. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවස්ථානුකූලව ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් බැහැරව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අයිතිය සභාව සතුය.

05. අයදුම්පත්‍රය සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්ද අමුණා එවිය යුතුය.

06. මිල ගණන් ඉදිරිපත් කර ඇණවුම් කල විට භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන්ගේ හා නියමිත ප්‍රමිතියෙන් භාණ්ඩ හා සේවා සපයනු නොලබන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කොට නම් අසාදුගත කරනු ලැබේ.

07. beliattaps.lk වෙබ් අඩවියට පිවිස අයදුම්පත්‍රය බාගත කල හැකිය.

වැඩි විස්තර සඳහා **0472243275** යන දුරකථන අංකය මගින් සතියේ දිනවල කාර්යාල වේලාවන් තුලදී විමසා දැන ගත හැකිය.

එම්.පී.එන්.ජයන්ත මුතුමාල,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

<u>බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව</u>

<u>2027 වර්ශයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම</u>

<u>අයදුම්පත්‍රය</u>

01. සැපයුම්කරු/නිෂ්පාදකයා/අයිතිකරු:

02. ව්‍යාපාරයේ නම:

03. ව්‍යාපාරයේ ලිපිනය:

04. දුරකතන අංකය:

05. ව්‍යාපාර ලියාපදිංචි අංකය හා දිනය:

(කරුණාකර සහතිකයේ පිටපතක් අමුණන්න)

06.සැපයිය හැකි ණය පහසුකම් හා කාල සීමාව:

07.ඉල්ලුම්කරණ අයිතමය:

08.අයදුම්කරුවිසින් 2025/2026 වර්ෂවල භාණ්ඩ හා සේවා සපයනු

ලබන ආයතනයන්:

ඉහත තොරතුරු නිවරදි හා සත්‍ය බවත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ පුවත්පත් දැන්වීමේ සඳහන් කොන්දේසිවලට එකගවන බවත් ප්‍රකාශකර සිටිමි.

....

දිනය අයිතිකරු/සැපයුම්කරුගේ අත්සන

(ව්‍යාපාරික මුද්‍රාව තබන්න)